මාධ්‍ය මගින් සන්නිවේදනය සඳහා යොදාගන්නා භාෂාවේ එන ඇතැම් යෙදුම් වල වර්තමාන යෝග්‍යත්වය සම්බන්ධයෙන් අප සැලකිලිමත් විය යුතු බව පවසන්නේ, සමාජ චින්තනය හැඩගැස්වීම උදෙසා භාෂාව මගින් ලබාදෙන දායකත්වය ප්‍රබල වන බැවිනි.

ඊට උදාහරණ ලෙසින් ලිංගික අපරාධයන්/ලිංගික අපයෝජනයන් හැඳින්වීම සඳහා වර්තමානයේද භාවිතා වන දූෂණය වැනි යෙදුම් ගත හැක. සැබවින්ම තවමත් නීති පොත් වල පවා සඳහන් වන්නේ දූෂණය යන යෙදුමයි. කෙසේ නමුත් මෙහි ගැටළුව වන්නේ, දූෂණය වැනි යෙදුම් ඔස්සේ අදාළ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වීමයි. මේ ඔස්සේ ලිංගික අපරාධයකට/අපයෝජනයකට ලක්වූ වින්දිතයින් කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ නිර්මාණය වේ. එනිසා, දූෂණය වැනි යෙදුම් වෙනුවට ලිංගික අපරාධය හෝ බාලවයස්කරුවෙකු සම්බන්ධයෙන් නම් ළමා ලිංගික අපයෝජනය වැනි යෙදුම් වඩාත් උචිත නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress#Mawbima #Divaina**